# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,450 - 2025 අගෝස්තු මස 15 වැනි සිකුරාදා - 2025.08.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | 1008 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... | 1010 |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |

| | පිටුව |
|---|---|
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... | — |
| දේපළ විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 1011 |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 සැප්තැම්බර් 04 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 අගෝස්තු 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජුනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1007 - B 082711— 5,403 (2025/08)
F 1 -

# තනතුරු - ඇබෑර්තු

## හක්මණ ප්‍රාදේශීය සභාව

හක්මණ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති දකුණු පළාත තුළ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | | |
|---|---|---|
| තනතුරු නාමය | - | රියදුරු (දෛනික පදනම) |
| තනතුරු සංඛ්‍යාව | - | 01 |
| රැකියාවේ ස්වභාවය | - | 2025.12.31 දින දක්වා පමණක් දෛනික වැටුප් ගෙවීමේ පදනම මත ලියාපදිංචි කර සේවය ලබා ගනු ලැබේ. ඉන් ඔබ්බට සේවය දීර්ඝ කරනු නොලැබේ. |
| වැටුප් කේතය | - | PL 3 - 2025 |
| වැටුප් ක්‍රමය | - | රු. 42,780.00 - 10 x 490 - 10 x 540 - 10 x 590 - 12 x 630 - රු. 66,540.00 |

01. **බඳවා ගැනීමේ අවම අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් :**

1.1 දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් ඕනෑම විෂයයන් 06 ක් සමත් වීම;

1.2 මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද මෝටර් රථ පැදවීමේ බලපත්‍රය හා නිපුණත්වය පිළිබඳ සහතිකය ලබා තිබීම;

02. **වයස් සීමාව -** අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.

03. **බඳවා ගැනීමේ පොදු කොන්දේසි :**

3.1 අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය;

3.2 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 කාල සීමාව (අනුගාමී වසර 03 ක්) දකුණු පළාත තුළ ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය;

3.3 විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය;

3.4 දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියෙන් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු හෝ රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවකු නොවිය යුතුය.

3.5 සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක හා වෘත්තීය ප්‍රවීණතා තහවුරු කර ගැනීමේ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

04. **සේවා නියුක්ත කරලීමේ කොන්දේසි :**

4.1 සේවා අවශ්‍යතාව අනුව හක්මණ ප්‍රාදේශීය සභාව සතු කැබ්රථ, ට්‍රැක්ටර්, අත්ට්‍රැක්ටර්, ජල බවුසර්, ගලී බවුසර්, ටිපර් රථ කම්පැක්ටරය ආදී ...... රථ වාහනවල රාජකාරී සඳහා යොදවනු ලැබේ.

05. **අයදුම්කළ යුතු ආකාරය :**

5.1 මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ කඩදාසිවල අයදුම්පත සකස් කර 2025.08.22 දිනට පෙර සභාපති, හක්මණ ප්‍රාදේශීය සභාව, හක්මණ යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

5.2 අයදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ "රියදුරු තනතුර සඳහා" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

5.3 අසම්පූර්ණ, අපැහැදිලි අයදුම්පත් හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.4 අයදුම්පත සමග පහත සඳහන් ලේඛනවල සහතික කරන ලද පිටපත් එවිය යුතුය.-

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතික හා නිපුනතා සහතිකය;
3. පදිංචිය තහවුරු කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකයය;
4. ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතය;
5. මෑතක දී ලබා ගත් චරිත සහතික 02 ක්.

06. අයදුම්පත් කැඳ වූ පසු හෝ කැඳවන අතරතුරේ දී හෝ බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හා මෙම නිවේදනය සංශෝධනය කිරීමේ බලය හක්මණ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා සතු වේ.

ආර්. එම්. ඩබ්. සෙනෙවිරත්න,
සභාපති,
හක්මණ ප්‍රාදේශීය සභාව.

2025 අගෝස්තු මස 04 වැනි දින,
හක්මණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**හක්මණ ප්‍රාදේශීය සභාවේ රියදුරු තනතුර සඳහා දෛනික පදනම මත බඳවා ගැනීමේ අයදුම් පත්‍රය**

1. මුලකුරු සමග නම : ..........................................................................
2. මුලකුරු වලින් හැඳින්වෙන නම : ..........................................................................
3. පෞද්ගලික ලිපිනය : ..........................................................................
4. උපන් දිනය : අවුරුද්ද :..............., මාසය :..............., දිනය :.................
5. ස්ත්‍රී/පුරුෂ භාවය : ..........................................................................
6. විවාහක/අවිවාහක බව : ..........................................................................
7. ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................
8. දුරකථන අංකය : ..........................................................................
9. දිස්ත්‍රික්කය : ..........................................................................
10. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ..........................................................................
11. සමත්ව ඇති ඉහළම විභාගය : ..........................................................................
12. ශිල්පීය නිපුනතා : ..........................................................................
13. වෘත්තීය සුදුසුකම් : ..........................................................................
14. ඔබට උසාවියෙන් දඬුවම් පවරා තිබේද? : ..........................................................................
15. එසේ නම් දඬුවමේ ස්වභාවය : ..........................................................................

මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බවට මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුව හොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් දනිමි.

...........................
අයදුම්කරුගේ අත්සන.

දිනය :...........................

08-186

# පළාත් පාලන නිවේදන

**මාතලේ ප්‍රාදේශීය සභාව**

1893 අංක 09 දරන ගෝඝාතක ආඥා පනත යටතේ විරෝධතා කැඳවීම

මාතලේ ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ ජූලි මස 03 දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක 5.9 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. එම්. කේ. එස්. බී. ජයරත්න,
සභාපති,
මාතලේ ප්‍රාදේශීය සභාව,
පලාපත්වල.

2025 ජූලි මස 20 වැනි දින,
මාතලේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1893 අංක 09 දරන ගෝඝාතක ආඥාපනතේ 03 වගන්තියේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව මාතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2025 වර්ෂය සඳහා ගවමස් වෙළඳසැලක් පවත්වාගෙන යාම සඳහා පහත උපලේඛනයේ දක්වා ඇති අය වෙනුවෙන් බලපත්‍ර ලබා දීම පිළිබඳ විරෝධතා කැඳවනු ලබන අතර, ඒ සඳහා මාතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි හා ජීවත්වන අයෙක් හෝ අයවලුන් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන හේතුවක් පදනම් කර ගෙනද යන්න පිළිබඳ විස්තර ලිඛිතව පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ දා සිට දින 14 ක් ඇතුළත මාතලේ ප්‍රාදේශීය සභාව වෙත දන්වා එවිය යුතු බව ගෝඝාතක ආඥා පනතේ 7(2) වගන්තිය ප්‍රකාරව මාතලේ ප්‍රාදේශීය සභාව තීරණය කරන්නීය.

**උපලේඛනය**

| *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *ගවමස් වෙළඳසැල පවත්වාගෙන යන ස්ථානය* | *මස් වර්ගය* |
|---|---|---|
| එම්. එම්. ෆායිස්,<br>අංක 18/ඩී,<br>කැටවල,<br>මඩවල උල්පත | මුස්ලිම් පල්ලිය ඉදිරිපිට<br>කැටවල,<br>මඩවල උල්පත | ගවමස් |

08-157

# විවිධ දැන්වීම්

## හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව

2025 ඇසළ පෙරහැර විශේෂ පොළ

විවිධ ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2025 අගෝස්තු මස සහ සැප්තැම්බර් මස ඇතුළත පවත්වනු ලබන හඟුරන්කෙත ඓතිහාසික ඇසළ පෙරහැර සමයේ විවිධ ගාස්තු අය කිරීමට 2025/07/29 දින පැවති මහ සභා රැස්වීමේ දී (ඉ) (2) (xviii)(vii) තීරණ අංක යටතේ උපලේඛන අංක 01 හි සඳහන් පරිදි ගාස්තු අය කිරීමට මා විසින් තීරණය කරන ලදී.

ජේ. එම්. ඒ. ජී. ලයනල් ගුණරත්න,
සභාපති,
හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව.

**උපලේඛන අංක 01**

| *ව්‍යාපාරයේ ස්වභාවය* | | *ව. අ. 15-30 රු. ශත* | *ව. අ. 30-75 රු. ශත* | *ව. අ. 75-125 රු. ශත* |
|---|---|---|---|---|
| 1. | ලී බඩු වෙළෙඳාම | 1,100.00 | 1,400.00 | 2,000.00 |
| 2. | ඇලුමිනියම් භාණ්ඩ වෙළෙඳාම | 800.00 | 1,300.00 | 1,500.00 |
| 3. | ප්ලාස්ටික් භාණ්ඩ වෙළෙඳාම | 700.00 | 1,100.00 | 1,400.00 |
| 4. | රෙදි වෙළෙඳාම | 800.00 | 1,000.00 | 1,400.00 |
| 5. | පිත්තල බඩු වෙළෙඳාම | 800.00 | 1,100.00 | 1,400.00 |
| 6. | තේ කුඩු වෙළෙඳාම | 800.00 | 900.00 | 1,400.00 |
| 7. | රසකැවිලි වෙළෙඳාම | 700.00 | 850.00 | 1,000.00 |
| 8. | පැදුරු වෙළෙඳාම | 600.00 | 900.00 | 1,000.00 |
| 9. | නිමිරෙදි වෙළෙඳාම | 800.00 | 1,000.00 | 1,400.00 |
| 10. | සුවඳ විලවුන් හා විසිතුරු භාණ්ඩ වෙළෙඳාම | 700.00 | 750.00 | 1,200.00 |
| 11. | වීදුරු භාණ්ඩ වෙළෙඳාම | 600.00 | 700.00 | 1,000.00 |
| 12. | අයිස්ක්‍රීම් වෙළෙඳාම | - | 1,000.00 | 1,500.00 |
| 13. | සපත්තු භාණ්ඩ වෙළෙඳාම | 700.00 | 1,000.00 | 1,300.00 |
| 14. | ලොතරැයි කූට් වෙළෙඳාම | 700.00 | 1,000.00 | 1,300.00 |
| 15. | වීදුරු උපකරණ | 800.00 | 1,000.00 | 1,500.00 |
| 16. | වානේ භාණ්ඩ විකිණීම | 800.00 | 1,900.00 | 2,000.00 |
| 17. | ගමන් බෑග් වෙළෙඳාම | 750.00 | 900.00 | 1,200.00 |

| ව්‍යාපාරයේ ස්වභාවය | | ව. අ. 15-30 රු. ශත | ව. අ. 30-75 රු. ශත | ව. අ. 75-125 රු. ශත |
|---|---|---|---|---|
| 18. | විසිතුරු මල් අලෙවිය | 700.00 | 800.00 | 1,200.00 |
| 19. | පරිගණක ආශ්‍රයෙන් තොරතුරු ලබා ගැනීම | 700.00 | 800.00 | 1,000.00 |
| 20. | ජංගම දුරකථන වෙළඳකුටි | 1,000.00 | 1,200.00 | 1,400.00 |
| 21 | වීසීඩී/ඩීවීඩී/කැසට් පට අලෙවිය | 700.00 | 1,000.00 | 1,300.00 |
| 22 | හිස්වැසුම් අලෙවිය | 600.00 | 800.00 | 1,000.00 |
| 23. | සිසිල් බීම අලෙවිය | 700.00 | 900.00 | 1,300.00 |
| 24. | සංචාරක වෙළෙඳාම | - | - | 500.00 |
| 25. | තාවකාලික විනෝද මේලා බලපත්‍ර ගාස්තු | - | - | 1,500.00 |
| 26. | විදුලි උපකරණ අලෙවිය | 1,000.00 | 1,500.00 | 2,000.00 |
| 27. | විනෝද ක්‍රීඩා | 800.00 | 1,000.00 | 1,500.00 |

* ඉහත සඳහන් වෙළෙඳ ආයතනවලින් ගාස්තු අය කිරීමේ දී වර්ග අඩි 125ට වැඩිවන සෑම වර්ග අඩියකටම රු. 10ක ගාස්තු අය කිරීමට ද,

* විනෝද බදු සහ සැණකෙළිවලින් අය කරන ප්‍රවේශ පත්‍රවලට ප්‍රාදේශීය සභාවේ මුද්‍රා තැබිය යුතුය.

* ඇසළ මේලා සැණකෙළි භූමියේ තිබෙන සියලුම වෙළෙඳසැල් සහ තාවකාලික වෙළෙඳාම සඳහා අදාළ තාවකාලික කුටි ඉදි කිරීමට වෙන් වෙන් ගාස්තු ගෙවිය යුතු අතර, තාවකාලික අවසර පත්‍ර ගාස්තුවක් ලබා ගත යුතුය.

* ඇසළ පෙරහැර කාලසීමාව තුළ ජංගම දුරකථන අලෙවිය හා සිම් කාඩ් අලෙවිය සඳහා ස්ථානයක් පවත්වාගෙන යන වෙළෙඳ හිමියන් විසින් වෙනම ස්ථානයක් පවත්වාගෙන යන්නේ නම් රු. 1,900.00 මුදලක් ද එසේ නොමැතිව වෙනම ආයතනයක් විසින් වෙළෙඳ ස්ථානයක් පවත්වාගෙන යන්නේ නම් රු. 2,300.00 ගාස්තුවක් ද,

* හිසින් හා අතින් වෙළෙඳාම් කරන හා ජංගම කරත්ත මගින් වෙළෙඳාම් කරන සංචාරක වෙළෙඳුන්ගෙන් රු. 500.00 අවසර පත්‍ර ගාස්තුවක් ද,

* විනෝද බදු අය කිරීමේ දී හෝ බදු ආඥාපනතේ කොන්දේසි ඒ අයුරින් ක්‍රියාත්මකවන අතර විනෝද සැණකෙළිවලින් 15% ක විනෝද බද්දක් ද,

* නවතා තබා ඇති වාහනයකින් වෙළෙඳාම් කරන විට වර්ග අඩියකින් රු. 200.00 ක් ද,

* පෙරහැර ප්‍රචාරක සේවාවන් සඳහා රු. 50,000.00 ක අවම මුදලක් අය කිරීමට තීරණය කරන ලදී.

08-227

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.